# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2276/51 - 2022 අප්‍රේල් මස 22 වැනි සිකුරාදා - 2022.04.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ වන මම, නාගරික සංවර්ධන හා නිවාස විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත මෙහි පහත සඳහන් උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති ඉඩම මාලඹේ මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය සඳහා ප්‍රවේශ මාර්ගයක් ඉදිකිරීමේ අරමුණ සඳහා කඩිනමින් අවශ්‍යව ඇති බව මාගේ මතය වන හෙයින්, එකී ඉඩම් අදාළ කාර්යය සඳහා අවශ්‍ය බව මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

ගෝඨාභය රාජපක්ෂ,
ජනාධිපති.

2022 අප්‍රේල් මස 11 වැනි දින,
කොළඹ,
ජනාධිපති කාර්යාලයේදී ය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 502 සී - සල්මල් උයන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ හල්බරාව ගමේ පිහිටි නාගරික සංවර්ධන අධිකාරියේ සහකාර අධ්‍යක්ෂ (ඉඩම්) පී. එස්. රණවීර මහතා විසින් 2021.11.29 දිනැතිව සකස් කරන ලද සැලැස්මේ අංක 01 මගින් දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් 60ක් පමණ වූ හල්බරාව සහ හල්ගහවත්ත නමැති ඉඩම් වලට මායිම් පහත පරිදි වේ.

**කැබලි අංක 01**

| | | |
|---|---|---|
| *උතුරට* | : | නාගරික සංවර්ධන අධිකාරිය හිමිකම් කියන ඉඩම ; |
| *නැගෙනහිරට* | : | අංක 70, එස්. දී. එස්. ජයසිංහ මාවත, කොහුවල, නුගේගොඩ පිහිටි ඉන්ටර්නැෂනල් කන්ස්ට්‍රක්ෂන් කන්සෝටියම් ප්‍රයිවට් ලිමිටඩ් හිමිකම් කියන ඉඩම ; |
| *දකුණට* | : | නාගරික සංවර්ධන අධිකාරිය සතුව පවතින ඉඩම ; |
| *බටහිරට* | : | වරිපනම් අංක 484/2/1 රෙබ්මෙක් හෝල්ඩින්ග්ස් (පුද්.) සමාගම හිමිකම් කියන ඉඩම සහ හිමිකරු සොයාගත නොහැකි ඉඩම. |

EOG 04 - 0130

1A - G 36625 — 15 (2022/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*